Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

**2008 PUBLIC EXAMINATION**

# Sinhala
## Continuers Level

**Thursday 16 October: 2 p.m. Eastern Standard Time**

Reading Time: 10 minutes
Working Time: 2 hours and 50 minutes

- *You have 10 minutes to read all the papers and to familiarise yourself with the requirements of the questions. You must not write during this time.*
- *Monolingual and/or bilingual printed dictionaries may be consulted during the reading time and also during the examination.*

## Section 1: Listening and Responding (30 marks)

**Instructions to Students**

1. Allow approximately 50 minutes for Section 1.
2. Write all your answers to the questions in Section 1 in this booklet in blue or black ink or ball-point pen. Space is provided for you to make notes.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

*This examination is used for the HSC (New South Wales), the NTCE (Northern Territory), the SACE (South Australia), the TCE (Tasmania), the VCE (Victoria), and the WACE (Western Australia).*

*© Victorian Curriculum and Assessment Authority 2008*

**Part A** (Questions 1–3)
(20 marks)

---

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and specific aspects of texts by identifying and analysing information and convey the information accurately and appropriately.*

---

You will hear THREE texts. Each text will be played twice. There will be a short break between the first and second playings in which you may make notes.

Listen carefully to each text and then answer the questions in ENGLISH.

**Marks**

You may make notes in this space.

**Text 1**

1. (a) What is the name of the project that has been planned by the Year 11 students? **1**

   (b) Why is this project important? **1**

   (c) What does this announcement ask students to do? **2**

Marks | You may make notes in this space.

**Text 2**

2. (a) Describe the changing trend in tourism in Sri Lanka. **2**

(b) What facilities are provided by the coastal hotels to suit the new trend in tourism? **3**

(c) What evidence is there to suggest that business organisations are aware of the new trend? **1**

Marks | You may make notes in this space.

**Text 3**

3. (a) Why is Kamala a suitable person to talk about women? **1**

   (b) What evidence in the text suggests that Sri Lankan women in the past had a great deal of freedom? **2**

   (c) How has the role of women in society changed? **4**

   In the past

   - 
   - 

   In the present

   - 
   - 

   (d) Describe the services provided by Kamala's organisation. **3**

**Part B** (Questions 4–5)
(10 marks)

---

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and specific aspects of texts by identifying and analysing information;*
- *convey the information accurately and appropriately.*

---

You will hear TWO texts, one relating to Question 4 and one relating to Question 5. Each text will be played twice. There will be a short break between the first and second playings in which you may make notes.

Listen carefully to each text and then answer the questions in SINHALA.

**Marks** | You may make notes in this space.

**Text 4**

4. (a) Why is this cricket match so important to Murali? **1**

මෙම ක්‍රිකට් තරඟය මුරලීට වැදගත් වන්නේ මන්ද?

(b) What has prevented Murali from achieving his goal in the past? **1**

මුරලිට මීට පෙර තම ඉලක්කය දිනා ගැනීම වැළැක්වූයේ කුමකින්ද?

(c) Describe how Murali’s achievement was celebrated. **2**

මුරලිගේ ජයග්‍රහණය සැමරූ අයුරු විස්තර කරන්න.

Marks | You may make notes in this space.

**Text 5**

5. (a) How is the natural environment used in the construction of the hotel? **2**

හෝටලය ඉදිකිරීමේදී ස්වභාවික පරිසරය යොදාගෙන ඇත්තේ කෙසේද?

(b) What kinds of cultural entertainment can visitors enjoy at the Kandalama Hotel? **2**

කණ්ඩලම හෝටලයට පැමිණෙන අමුත්තන්ට රසවිඳිය හැකි සංස්කෘතික රසාංග මොනවාද?

(c) How do Kanthi's interests differ from Rani's? **2**

කාන්ති හා රාණි ඇලුම් කරන දේවල් වෙනස් වන්නේ කෙසේද?

**End of Section 1**

Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

**2008 Public Examination**

# Sinhala

## Continuers Level

## Section 2: Reading and Responding (30 marks)

**Instructions to Students**

1. Allow approximately 1 hour and 15 minutes for Section 2.
2. Write all your answers to the questions in Section 2 in this booklet in blue or black ink or ball-point pen.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

*This examination is used for the HSC (New South Wales), the NTCE (Northern Territory), the SACE (South Australia), the TCE (Tasmania), the VCE (Victoria), and the WACE (Western Australia).*

*© Victorian Curriculum and Assessment Authority 2008*

**Part A** (Questions 6–7)
(20 marks)

---

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and/or specific aspects of texts, by, for example, comparing, contrasting, summarising, or evaluating, and convey the information accurately and appropriately.*

---

6. Read the text and then answer in ENGLISH the questions that follow.

## වරදකරු කවුද?

ගම්වලට වැදී වගාවන් පමණක් නොව ගේ දොර හා මිනිසුන්ගේ ජීවිත පවා විනාශ කරන අලි පිළිබඳව හා මිනිසුන් විසින් මරණයට පත් කරන ලද අලි පිළිබඳවද අපට නිතර අසන්නට ලැබේ. වේගයෙන් වඳවීගෙන යන අලි ආරක්ෂා කරගැනීම මෙන්ම, ඇතුන් නිසා විනාශයට පත්වන වටිනා මිනිස් ජීවිත බේරා ගැනීමද අපේ වගකීමකි.

චෝදනා ලැබූ අලියෙකුගෙනුත්, හිරිහැර විඳීමට සිදුවූ ගම් වැසියෙකුගෙනුත් අපි මේ ගැන අසා බලමු.

අලියා - අප ජීවත්වන විශාල වනාන්තර, මිනිසා තමන්ගේ දියුණුව හා අවශ්‍යතාවයන් සඳහා යයි කියමින්, ටිකෙන් ටික අල්ල ගන්නවා. ඒ විතරක්ද? අපේ පුරුදු වාස භූමි වලින් අපව ගෙන ගිහින් නුපුරුදු තැන්වල පදිංචි කළා. අප ජිවත්වන පෙදෙස්වල සීමාවන් ගැනවත් අපට තේරුමක් නැහැ. ඒ නිසා අවශ්‍ය ආහාර, ජලය ලබා ගන්න දැන් යන්න වෙලා තියෙන්නේ ගම්මානවලට. ඒ අය වගා කරලා තියෙන උක්, ඉරිඟු වගේ භෝගවලට අපිත් හරි කැමතියි. ඒ අයගේ වාස භූමිවලට ගියහම අපට කරන කරදර! අපව මරන්න නොයෙක් උපක්‍රම යොදනවා. ඒ නිසා අපට තියෙන විසඳුම අපේ ගැලවීම සඳහා ඔවුන්ගේ ජිවිත විනාශ කිරීමයි.

ගම් වැසියා - රටේ වැඩිවන ජනගහනය සමඟ මිනිසුන්ගේ අවශ්‍යතාවනුත් වැඩිවෙනවා. මිනිසුන්ට ලී සහ දර අවශ්‍යයි. එතකොට විදුලිය? විශාල ජලාශ හදන්න කැලෑ එළි නොකර කොහොමද? ඒ නිසා තමයි උන්ගේ හොඳට, වෙනත් ස්ථානවල පදිංචි කළේ. මිනිසුන්ට අවශ්‍ය ආහාර වගා කරගන්න කැලෑ එළි කරගන්න වෙනවා. ඉතින් මහන්සි නොබලා කරපු වගාවන්, ගෙවල් දොරවල් හා ජීවිත විනාශ කරන්න දීලා නිශ්ශබ්දව බලා ඉන්න පුළුවන්ද? ඒ නිසා මිනිසාට තමන්ගේ ආරක්ෂාවට මේ සතුන් මැරීමට උපක්‍රම යොදා ගන්න වෙනවා.

කවුද හරි? කවුද වැරදි? මට නම් තීරණයක් ගන්න අමාරුයි. ඔබේ තීරණය කුමක්වුවත් එයිනුත් පලක් නොවේ. මේ ජිවිත දෙකම වටිනා බැවින් රැකගත යුතුවේ.

ගීතා ගමගේ

QUESTIONS

**Marks**

(a) Why should elephants be protected by human beings? **1**

(b) Explain how elephants and humans justify their behaviour towards one another. **8**

| **Elephants** | **Human beings** |
|---|---|
| | |
| | |
| | |
| | |

(c) Explain the writer's difficulty when deciding 'who is at fault'. **1**

7. Read the text and then answer in ENGLISH the questions that follow.

**ආපදා කළමනාකරණ සැලසුමක් අවශ්‍යයයි**

මහත්මයාණෙනි,

සාමාන්‍යයෙන් වැස්ස අපේ රටට විශාල ආශිර්වාදයක් වුවද, කලින් කලට ශ්‍රී ලංකාවට කඩා වැටෙන මහ වැසි නම් සාපයක් වී ඇත. පහත් බිම් වැසි ජලයෙන් යටවී පවතින අතර කඳුරට ප්‍රදේශ නාය යෑම් හා පර්වත කඩා වැටීම්වලට භාජනය වෙමින් පවතී. මෙය ඉතා භයානක තත්වයකි.

මහවැසි මිනිස් ජීවිත මෙන්ම ඔවුන්ගේ ජීවනෝපායයන් ද විනාශ කර ඇත. ගේ දොර විනාශවූ පවුල් දහස් ගණන් සිටිති. ජලය අපවිත්‍ර වීමෙන් බීමට ජලය හිඟවී ඇති අතර, ජලය එකතුවී තිබීමෙන් මදුරුවන් බෝවීමට ද පටන්ගෙන තිබේ. පාචනය සහ උණසන්නිපාතය, මදුරුවන්ගෙන් බෝවෙන රෝගද පැතිරෙමින් පවතී. වතුරෙන් යට වීම නිසා මහා මාර්ග මෙන්ම දුම්රිය හා ගුවන් ගමන්ද අඩාලවී ඇත. ආපදා ප්‍රදේශවලට වෛද්‍ය ආධාර හා ආහාර සැපයීම පවා අපහසුවී ඇත. සහනාධාර හා පුනරුත්ථාපන කටයුතුවලට විශාල මුදලක් වැය කිරීමට සිදුවී තිබේ.

හිටපු සැලසුම් නිලධාරියකු ලෙස මගේ අත් දැකීම් අනුව මිනිස් ක්‍රියාකාරකම් මෙවැනි ආපදා වැඩිකිරීම කෙරෙහි සැලකිය යුතු ප්‍රමාණයකින් බලපා ඇත. පහත් බිම් බොහෝ දුරට යටවීමට හේතුවී ඇත්තේ අනවසර ඉදිකිරීම් හා දුර දිග නොබලා කරන සංවර්ධන කටයුතුවේ. මෙම ඉදිකිරීම් අමතර ජලය බැසයන මාර්ග අවහිර කර ඇත. තවද, ඇල වේලිවල කුණු හිරවීම ද වතුර බැසයෑමට බාධාවක්වී ඇත. හැමිල්ටන් ඇල රක්ෂිතය මෙයට කදිම උදාහරණයකි. කඳුරට වනාන්තර එළිකරමින් අහිතකර ලෙස වගාවන් කිරීම හා කඳු බෑවුම්වල ගොඩනැගිලි ඉදිකිරීම නායයෑමට හේතුවී ඇති බව පැහැදිලිවේ.

විපත් වළකා ගැනීමට මෙන්ම, හානිය අවම කරගැනීමට පියවර ගැනීම ඉතා වැදගත් වේ. නව ඉදිකිරීම් හා වගාවන් සඳහා එළිපෙහෙලි කිරීමේදී සැලසුම් සඳහා අධිකාරියක් පිහිටුවීම අත්‍යවශ්‍යව ඇත. මහ ජනතාවට මෙම අනතුරුදායක තත්ත්වය පැහැදිලි කරදී, ඔවුන් දැනුවත් කළ යුතුවේ. මනා ආපදා කළමනාකරණ සැලැස්මක් ද ක්‍රියාත්මක කළයුතුවන අතර ඒ සඳහා ප්‍රමාණවත් අරමුදලක් ද වෙන් කළ යුතුය.

මෙයට හිතවත්

සුමන සිල්වා

QUESTIONS

**Marks**

(a) What are the immediate effects of heavy rain? **4**

(b) Why does the writer refer to Hamilton Creek Reserve in his letter? **3**

(c) What steps could the government take to prevent the disasters? **3**

**Part B** (Question 8)
(10 marks)

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and specific aspects of a text by identifying, analysing, and responding to information;*
- *convey information coherently (structure, sequence, accuracy and variety of vocabulary and sentence structure) and appropriately (relevance, use of conventions of the text type).*

8. Read the text and then answer the question in 150–200 words in SINHALA on page 7.

## 2008 අගෝස්තු මස 15 වනදා පැවති ශ්‍රී ලංකා-ඔස්ට්‍රේලියා සිසු සංගමයේ කමිටු රැස්වීමේ වාර්තාවයි.

රෝගීව සිටින, අප සංගමයේ සාමාජිකයෙකුට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර සඳහා ආධාර පිණිස, කුමාර ගලප්පත්ති විසින් අධ්‍යක්ෂණය කළ 'සඳ ඔබයි' චිත්‍රපටය තිරගත කිරීමට සමිතියේදී තීරණය විය. ශ්‍රී ලංකාවේ ඉතා ජනප්‍රියවූ මෙම චිත්‍රපටයේ රවීන්, සුමාලි සහ කවින්ද ඇතුළු ප්‍රවීණ නළු නිළියන් රැසක් රඟපාන නිසා ත්, පවුලේ සැමට එකට නැරඹිය හැකි චිත්‍රපටයක් නිසා ත් මේ සඳහා ටිකට් පත් විකිණීම පහසුවන බව කාගේත් පිළිගැනීම විය. තවද මෙම චිත්‍රපටය ජාත්‍යන්තර සම්මාන ද දිනා ඇති අතර, ශ්‍රී ලංකාවේ පසුගිය වසරේ හොඳම නළුවාට හා නිළියට ද, හොඳම අධ්‍යක්ෂණය හා හොඳම චිත්‍රපටය ලෙසින් ද සම්මාන දිනා ඇත.

නොවැම්බර් මස 25 වනදා සවස 2 ට සහ 5 ට, චිත්‍රපටය තිරගත කිරීම සඳහා විශ්වවිද්‍යාල ශාලාව ලබාගත හැකිවන බව සභාපති දන්වා සිටියේය. ටිකට් පතක මිල ඩොලර් 15 කට නියම කෙරුණි.

මෙයට හොඳ ප්‍රචාරයක් ලබාගැනීම සඳහා බෙදා හැරීමට, අත් පත්‍රිකාවක් පිළියෙල කිරීම නිමල්ට බාර විය.

වෙනත් කරුණු නොවූ බැවින් කමිටු රැස්වීම අවසන් විය.

QUESTION

Write a leaflet of 150–200 words in Sinhala persuading people to come to the film *You are the moon*. Include the reason for screening, details about the film, and any other appropriate information.

150 ත් 200 ත් අතර වචන යොදා ගනිමින් 'සඳ ඔබයි' චිත්‍රපටය නැරඹීමට ජනතාව පොළඹවන සේ අත් පත්‍රිකාවක් සිංහලෙන් පිළියෙල කරන්න. එය තිරගත කිරීමට හේතුව, එහි විස්තර සහ අනෙකුත් අවශ්‍ය කරුණුද ඇතුළත් කරන්න.

*Do not remove this page from the question booklet.*

| Student/Registration Number | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

Sinhala
Continuers Level

| Centre Number | | | | | | |
|---|---|---|---|---|---|---|

Question 8



PLEASE TURN OVER

**End of Section 2**

Student/Registration Number | | | | | | | | | | | | Centre Number | | | | | | |

## 2008 Public Examination

# Sinhala
## Continuers Level

### Section 3: Writing in Sinhala (15 marks)

**Instructions to Students**

1. Allow approximately 45 minutes for Section 3.
2. Write your answer to a question from Section 3 in this booklet in blue or black ink or ball-point pen. Space is provided for you to make notes.
3. You must answer ONE question in SINHALA.
4. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
5. All question booklets will be collected at the end of the examination.

*This examination is used for the HSC (New South Wales), the NTCE (Northern Territory), the SACE (South Australia), the TCE (Tasmania), the VCE (Victoria), and the WACE (Western Australia).*

© Victorian Curriculum and Assessment Authority 2008

**Section 3** (Questions 9–12)
(15 marks)

---

*When judging performance in this section, the examiner(s) will take into account the extent to which the student demonstrates:*

- *relevance and depth of treatment of ideas, information, or opinions;*
- *accuracy and range of vocabulary and sentence structures;*
- *the capacity to structure and sequence response and capacity to use conventions of the text type.*

---

Answer ONE question from this section in 200–250 words in SINHALA.

9. After completing their Year 12 examinations, some students prefer to spend a gap year in a foreign country. Write an evaluative article for the school magazine discussing the advantages and disadvantages of taking a gap year.

   12 වසර විභාගයෙන් පසුව, විදේශ රටක වසරක විවේක කාලයක් ගත කිරීමට බොහෝ සිසුහු කැමැත්තක් දක්වති. වසරක විවේක කාලයක් ගැනීමේ වාසි සහ අවාසි සාකච්ඡා කරමින් ඇගැයීමේ ලිපියක් පාසල් සඟරාවට ලියන්න.

10. Write a report for a newspaper in Sri Lanka providing information about how the New Year is celebrated in Australia.

    ඔස්ට්‍රේලියාවේ සිංහල අවුරුද්ද සමරන ලද අන්දම පිළිබඳව විස්තර ඇතුළත් වාර්තාවක් ශ්‍රී ලංකාවේ ප්‍රවෘත්ති පත්‍රයකට ලියන්න.

11. Write an informal letter to a friend in Sri Lanka describing the special experiences you had during a week-long camping trip organised by your school.

    ඔබේ පාසල මඟින් සංවිධානය කරන ලද සතියක කඳවුරු චාරිකාවේදී ඔබ ලද විශේෂ අත්දැකීම් විස්තර කරමින් ශ්‍රී ලංකාවේ සිටින මිතුරෙකුට හෝ මිතුරියකට ලිපියක් ලියන්න.

12. 'The truth always wins.' Write an imaginative short story for young readers on this topic.

    "සත්‍යය සැමවිටම ජයගනී". මෙය මාතෘකා කර, තරුණ පාඨකයන් සඳහා මනඃකල්පිත කෙටි කතාවක් ලියන්න.

You may make notes in this space.



PLEASE TURN OVER

Question Number:

**End of Section 3**